sinhalaebooks.com



# රැවටිල්ල- වසන්තා විජේරත්න

සතිඅග අරුණ පුවත්පතේ පළවූ කෙටිකතාවක් පාඨකයන්ගේ කියවීමේ පහසුව උදෙසා pdf ලෙස සකසන ලද්දේ sinhalaebooks.com විසිනි.

sinhalaebooks.com

**"මල්ලිකා මිස් අද උදෙන්ම ඔෆිස් එකට ඇවිත් වගෙයි."**

වතු අධිකාරි පාලන කාර්යාලයේ සේවය කරන මල්ලිකා වෙනදාට වඩා කලින්ම ඇවිත් ඉන්නව දැකල එසේ කීවේ යතුරු රාජකාරිය භාරව සිටි කාර්යාල කාර්ය සහායක කන්දයියාය.

**"අනිද්දට පඩි ගෙවන්න තියෙනවනෙ, වැඩ හුඟක් තියෙන නිසයි අද උදෙන්ම ආවෙ."**

එහෙත් ඇය සඳහන් කළේ සැබෑ හේතුව නොවේ.

උදෙන්ම පැමිණීමේ සැබෑ හේතුව දැන ගන්නට ලැබෙන්නේ දහවල් වී අනෙකුත් අය කාර්යාලයට පැමිණි පසුය.

මල්ලිකා ඇවිත් පැය බාගයක් පමණ ගතවෙන කොටම වතු අධිකාරි ජෝශප් මහත්තයගෙ පියුන් උන්නැහේ පණිවුඩයක් අරගෙන ආවේය.

**"මල්ලිකා මිස් ඇවිත් ඉන්නව නම් එන්න කිව්ව කියල."**

යුරෝපීය සමාගමකට අයත්ව එක් පසෙක රබර්ද, අනෙක් පස තේද, තවත් කොටසක කටු පොල්ද වගාකර ඇති මෙම වතුයායේ අධිකාරිව සිටි ජෝශප් මහතාගේ කාර්යාල කාමරය පිහිටා තිබෙන්නේ පාලන කාර්යාලයට තරමක් ඈතිනි.

sinhalaebooks.com

රබර් අතුවල එල්ලෙමින් එහා මෙහා දුව පනින වඳුරු රැනත්, දවස පුරා හඬ දෙන විවිධ පක්ෂීන්ගේ නාදයත් නොවන්නට මෙහි පරිසරය ඉතා නිසංසලය, එමෙන්ම සිසිල්ය.

ජෝශප් මහතාගේ කැඳවීමක් ලැබුණ විට දවසේ කොයි වේලාවක වුවත් මල්ලිකා පළමුවෙන් දුවන්නේ පනාවක් සහ ඇඟ ගල්වන සුවඳ විලවුන් ආදිය රැගෙන වොෂ් රූම් එකේ කණ්ණාඩිය ළඟටය. ඇය අධිකාරිවරයා හමුවට යන්නේ ඒ ආකාරයට විසිත්ත කාමරයට ගොස් හැඩවැඩ වීමෙන් ඉක්බිතිවය.

මේ වනවිටත් කාර්යාලයේ සේවය කරන අනෙකුත් අය පැමිණ සිටියේ නැත. මල්ලිකා අධිකාරිතුමා හමුවීමට ගියේ විසඳාගත යුතුව තිබූ ගැටලු කීපයකට අදාළව මේසය මත සකස් කර තිබූ ලිපිගොනු කීපයක්ද රැගෙනය.

එසේ ලිපිගොනු කීපයක් රැගෙන ගියේ ආපසු එන විට රාජකාරි අවශ්‍යතාවක් නිසා අධිකාරි හමුවීමට ගිය බව අනෙකුත් අයට හැඟවීමටය.

මල්ලිකා මෙදින උදෙන්ම පැමිණීමේ හේතුව දැන ගන්නට ලැබෙන්නේ ටිකක් දහවල් වන විට අනෙකුත් අය කාර්යාලයට පැමිණියාට පසුවය.

**“මල්ලිකාගෙ මහත්තය ඊයෙ රාත්‍රියෙ ගෙදර ආවෙ නැතිලු.”**

sinhalaebooks.com

ඒ ආරංචිය ගෙන ආවෙ මල්ලිකාගෙ නිවසට යාබද නිවසක පදිංචිව සිටින අල්විස්ය.

**"මල්ලිකා ජෝශප් මහත්තෙය එක්ක ෆිල්ම් එකක් බලන්න ගිය වෙලාවෙ ඇන්තනිත් වෙන ගෑනියෙක් එක්ක ඒ හෝල් එකටම ෆිල්ම් එක බලන්න ගිහින් අහුවෙලාලු. ජෝඩු දෙක එකිනෙකා දකින්න ඇති. ඊට පස්සෙ මොකද වුණේ කියල දන්නෙ නැහැ."**

ඒ තොරතුර ගෙන ආවේ එහි සේවය කරන පීරිස්ය.

**"එහෙනම් වැඩේ දිග්ගැහිල වෙන්න ඇති"**

තව කෙනෙක් පැවසීය.

අධිකාරිවරයාට ඒ අවස්ථාවේ මල්ලිකා කැඳවීමට ලොකු වුවමනාවක් හෝ හදිසි අවශ්‍යතාවක් නොවීය. ඔහුට වුවමනා කළේ මල්ලිකාගෙ ස්වාමියා වූ ඇන්තනි ඊයෙ හවස ගෙදර ආවට පස්සෙ ප්‍රශ්නයක් එහෙම ඇති වුණාද කියල දැන ගන්නටය.

**"මොකද ඊයෙ ඇන්තනි ගෙදර ආවට පස්සෙ වුණේ?"**

වතු අධිකාරී ජෝශප් මහතා මල්ලිකාගෙන් විමසීය.

**"මොකුත් වුණේ නැහැ. එයා ඊයෙරාත්‍රියෙ ආවෙ නැහැ."**

**"මල්ලිකා ඔය සම්බන්ධෙ ගැන දන්නෙ නැද්ද?"**

sinhalaebooks.com

ජෝශප් මහතා යළි විමසයි.

**"මට නම් කිසිම දෙයක් දැනගන්න ලැබුණේ නැහැ. කවද වුණත් මිනිහ ගෙදර ආපුවාම උපාසකයෙක් වගේ නිශ්ශබ්දවමනෙ ඉන්නෙ."**

ඒ මල්ලිකාගෙ පිළිතුරය.

**"සමහර විට ඇන්තනි ඒ ගෑනිව බැඳලද දන්නෙත් නැහැ."**

ජෝශප් මහතා කීවේ සැකයෙන් යුතුවය.

**"එහෙම වෙන්න බැහැ. මාත් එක්ක කසාදෙ අවලංගු කරල නැහැනෙ."**

මල්ලිකා විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කළාය.

**"ඊයෙ කළුතරදි අපි ඒගොල්ලන්ව දැක්ක වගේම ඒ ජෝඩුවත් අපිව දැක්කට පස්සෙනෙ ඉක්මනින් මග ඇරල ගියෙ. අද ඒවි. ටිකක් බලමුකො..."**

ජෝශප් මහතා පැවසුවේ එපමණකි.

මල්ලිකා අධිකාරිවරයා හමුවී ආපසු කාර්යාලයට එන විට කාර්යාලයේ අයට සිද්ධිය ආරංචි වී කාගෙ කාගෙත් කටවල් පණ ගැන්වී තිබුණි. ඒ අවස්ථාවේ එකිනෙකා එක එක ඇනුම්පද කීහ.

**"දැන් ඉතින් නිදහස්නෙ."**

sinhalaebooks.com

ඒ වයස්ගත ඥානම්මාගේ අදහසය.

**"හැංගිමුත්තන් කෙළිය ඉවර වෙයි වගේ."**

මෙසේ කීවේ කවදත් මේ සම්බන්ධයට විරුද්ධව අදහස් පළ කළ පාපැදි පණිවුඩකරු ගෝමස්ය.

**"ඇන්තනි ගිය තැනක බින්න බහීවි."**

තවත් කෙනෙක් වැඩිපුර කාටත් නොඇසෙන්නට මිමිණුවේය.

**"ජෝශප් එක්ක නටන නාඩගම ඇන්තනි දන්නෙම නැද්ද කියල අපි ඇහුවාම කිව්වෙ ආරංචි වුණාට බයක් නැහැ, එයාව ෂේප් කරගන්න හැටි දන්නව කියල."**

පහුගිය දවසක මල්ලිකා දුන් පිළිතුර සිහිපත් කර දුන්නේ ගුණදාසය.

එය අසා සිට ක්‍රිෂ්ණා කීවේ, "දැන් නම් නියමෙටම ෂේප් වෙලා වගෙයි" කියාය. මේ සියලු අදහස් පළ කිරීම්වලට සවන් දී සිටි ගණකාධිකාරී කීවේ, "ඔය ටික වෙයි කියල මම කලින්ම කිව්වනෙ" කියාය.

මේ සියලු ඇනුම්පද අසමින් මල්ලිකා කිසිවක් කතා නොකරම සිටියේ ලොකු ඉවසිල්ලකිනි.

sinhalaebooks.com

මල්ලිකා අවබෝධ කරගෙන සිටියේ තම ස්වාමියා වූ ඇන්තනි ඇයට බියසුලු බවක් දක්වන 'නෝන්ජල්' පුද්ගලයකු වශයෙනි. දිනක් ඔහු පාර අයිනේ කඩපිලක් ඉදිරිපිට සිගරැට්ටුවක් උරමින් සිටියදී මල්ලිකා එනු දැක වහාම සිගරැට්ටුව බිම දමා පාගා දැමීමට ක්‍රියාත්මක වූයේ මල්ලිකාට බියසුලුකමක් දැක්වූ නියාවෙනි.

ඇන්තනි, මල්ලිකාට හඟවා ඇති තරමින් මත්පැනට හෝ දුම්පානයට ඇබ්බැහි වූ කෙනෙක් නොවේ. සිගරැට්ටුව බිම දමා පාගා දැමුවත් මල්ලිකා ඈත දී එය දුටුවාය. එහෙත් ඇය එය නොදුටුවා සේ නොසලකා හැරියේ ඇන්තනි තමාට ඇති බිය පක්ෂපාතීකම නිසා එසේ කළ බව නිශ්චය කළ බැවිනි.

වත්තේම නිල නිවාසයේ පදිංචිව සිටින වතු අධිකාරී ජෝශප් මහතා මෙම වතුයාය භාරව පැමිණියේ මෙයට වසර පහකට පෙරය. හතළිස් හැවිරිදි විය පසු කරමින් සිටි විවාහකයකු වූ ඔහුට දරුවන් කිසිවෙක් සිටියේ නැත. බිරිඳ ද අසනීප තත්ත්වයෙන් පසු වූවාය.

මුල් අවධියේ මල්ලිකා හැංගි හොරා වතු අධිකාරි ජෝශප් මහතා සමග සම්බන්ධකම් පවත්වාගෙන ගියද කල් යාමේදී එය පාලන කාර්යාලයේ හැම දෙනාම පමණක් නොව, වතුයායේ බොහෝ දෙනෙක්ද දන්නා රහසක් බවට පත් විය.

sinhalaebooks.com

යාබද වතුයායේ වැටුප් ගෙවීමට යන අවස්ථාවන්හි දී ද මුදල් අයකැමි වෙනුවට ජෝශප් මහතා කැඳවා ගෙන ගියේ මල්ලිකාවය. එසේ වැටුප් ගෙවන්නට ගිය බොහෝ දිනවලදී ගමන එතැනින් කෙළවර වූයේ නැත.

වැටුප් ගෙවීමේ කාර්යය නිම වීමෙන් පසු නගරයේ හෝටලයකට ගොස් දිවා ආහාරය ගැනීමටත්, වෙනත් විනෝද චාරිකාවල යෙදීමටත් ඔවුන් පුරුදු ව සිටි අතර එවන් දිනක ආපසු පැමිණියේ කාර්යාලයේ සේවා වේලාව අවසන් වන්නට ඔන්න මෙන්න කියා තිබියදීය.

මේ නිසා මල්ලිකා පාලන කාර්යාලයේ අනෙකුත් සහෝදර සේවක පිරිසට වඩා ඉහළින් පෙනී සිටින්නට නිතරම උත්සාහ කළ බව පෙනුණි. මේ හේතුවෙන් කාර්ය මණ්ඩලයේ මල්ලිකාට මතු පිටින් හොඳ හිත පෙන්වා සිටියත් වැඩි දෙනෙක් පසු වූයේ ඇයගේ ක්‍රියාකලාපය ගැන කලකිරීමෙනි.

කළුතර කච්චේරි බල ප්‍රදේශයට අයත් එවක පැවැති ප්‍රාදේශීය ආදායම් නිලධාරී කාර්යාලයක ඉඩම් අංශයට අනුයුක්තව සිටි ලිපිකරුවෙකු වූ ඇන්තනි එහි සේවය කල අනිකුත් සේවකයන් අතර අමුතු ම චරිතයක් විය.

ගම්බද පළාත්වල ප්‍රාදේශීය ආදායම් නිලධාරී කාර්යාලයට හෝ වර්තමාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රාජාකරි අවශ්‍යතා සඳහා වැඩිපුර මහජනතාව පැමිණෙන්නේ ආදායම් බලපත්‍ර අංශය හෝ රෙජිස්ට්‍රාර් අංශය හැරුණු විට ඉඩම් අංශයටය.

sinhalaebooks.com

සිය බිරිය වූ මල්ලිකා හමුවේ ඇන්තනි රඟ දැක්වූයේ සැබෑ චරිතය නොවේ. මත්පැන්ට හා දුම්පානයට ඇබ්බැහිව සිටි ඔහු තමා වෙත රාජකාරි වැඩකට පැමිණි බොහෝ දෙනාට ලොකු සිනහවක් පා,

**"යමු තේ එකක් බීල එන්න"**

කියා අමුත්තාට තේ පානයට ආරාධනය කරන්නේ ලෙන්ගතු කමකින් ආගන්තුක සත්කාරයක් කිරීමේ නියාවෙනි.

ඒ ආකාරයෙන් දිනකට දෙතුන් දෙනෙක්වත් කැන්ටිමට කැඳවා ගෙන යාම ඔහු පුරුද්දක් කර ගෙන සිටියේය.

කැන්ටිමේදී අමුත්තා සමග යමක් අනුභව කර තේ එක ද බී සිගරැට්ටුවක් ලබාගෙන දල්වා ගැනීමෙන් පසු ඇන්තනි මුදල් ගෙවීමට අයකැමි වෙත ගොස් ගෙවීම කිරීමට සිය සාක්කුවට අත යවන නමුත් අමුත්තා බිල ගෙවා අවසන් වන තුරුම සාක්කුවට යැවූ අත එළියට එන්නේ නැත.

ඒ අතර ඔහු හමුවට පැමිණි අමුත්තා තරුණ පහේ අයෙකු නම් අසුනෙන් නැගිට ඔහුගේ සාක්කුවට තට්ටු කර සිගරැට් එහෙම සාක්කුවේ නැද්දැයි විමසා සිටී. අමුත්තා අත සිගරැට් නොතිබුණොත් තමා පැමිණි රාජකාරිය ඉක්මනින් ඉටු කර ගැනීමට අවශ්‍ය නිසා,

**"මගේ අතේ නම් නැහැ ටිකක් ඉන්න සර්"**

sinhalaebooks.com

කියා කැන්ටිමට දිව ගොස් සිගරැට් පැකට්ටුවක් ම ගෙනවුත් දීම සාමාන්‍යයෙන් සිදුවූ දෙයකි.

ඇන්තනි එය භාර ගන්නේ,

**"අපරාදෙනෙ සිගරැට් ගේන්න ගියෙ. මම අතේ තියෙනවද කියල නිකටම ඇහුවෙ"**

කියා සිගරැට් පැකට්ටුව දෝතින්ම භාර ගැනීම සිරිත විය.

ඊළඟට ඔහු පැමිණි රාජකාරි අවශ්‍යතාව ඉටු කර දීම අරඹයි. එහෙත් එසේ රාජකාරිය ආරම්භ කරන්නේ එම රාජකාරිය එදාම නිම කර දීමෙන් වැළකී තවත් එක දවසක් හෝ ඔහු කාර්යාලයට ගෙන් වීමේ හැකියාව ඇත්ද යන්න ගැන විමසිලිමත්වය. එසේ හැකියාවක් ඇත්තේම නැත්නම් පමණක් අදාළ තැනැත්තාගේ අවශ්‍යතාව ඉටු කර දීම ඇන්තනිගේ සාමාන්‍ය පුරුද්දය.

ඔහු හමුවීමට අමුත්තෙක් පැමිණියේ සන්ධ්‍යා භාගයක නම් අදාළ රාජකාරිය ඉටු කර දීම නිම වන්නේ කාර්යාල වේලාව අවසන් වීමට ආසන්නයේදීය. ඇන්තනි එවැනි කෙනෙක් කැඳවා ගෙන ගියේ මත්පැන් සංග්‍රහයක් කිරීමට අසල පිහිටි බාර් එකකටය. මුදල් ගෙවීම සිදුවන්නේ දහවල් කැන්ටිමේ දී සිදු කරන ආකාරයටමය. ඇන්තනි ගේ මේ ක්‍රියාවලිය ගැන කාර්යාලයේ නොදන්නා කෙනෙක් සිටියේ නම් ඒ කලාතුරකිනි.

ඇන්තනි සිය බිරිඳ මල්ලිකා වතු අදිකාරි සමග නටන නැටුම් ගැන හොඳින්ම දැන සිටි නිසා **"මල්ලිකාට හොඳ නම් මට මොකදැයි"** යන න්‍යාය මත පිහිටා මතුගම ප්‍රදේශයේ මහා විද්‍යාලයක සේවය කරන ගුරුවරියක වූ තේජානි සමග සම්බන්ධයක් පවත්වා ගෙනගිය අතර ඒ බව මල්ලිකාට කිසි සේත් ආරංචි නොවන තැනට වග බලා ගැනීමට සමත් ව සිටියේය.

එක්තරා ඉරු දිනක මල්ලිකා උදේ පිටත්ව යාමට සූදානම් වෙද්දී ඇන්තනි ඇය අමතා,

**"ඔයා අදත් වැඩද"**

කියා විමසුවේය.

**"ඔව්. අද එහා කෑල්ලෙ අතිකාලයි ඒ ගොල්ලන්ගෙ අතුරු දීමනායි ගෙවන්න යනව"**

එවිට ඇන්තනි කීවේ,

**"මමත් අද යනව. ඔෆීස් එකේ. 'ඉන්ක්වයරි' එහෙක සාක්ෂියක් දෙන්න තියෙනවා"**

මෙසේ කියා දෙදෙනාම උදේ සිරිත් පරිදි රාජකාරි සඳහා නික්මුණහ.

මල්ලිකා ජෝශප් මහතා සමග ගොස් ඔහුගේ අධීක්ෂණය යටතේ පැවැති යාබද වතු යායේ සේවක අතිකාල ආදී දීමනා ගෙවීම් නිම කිරීමෙන් පසු කළුතර බලා පිටත් වූයේ දිවා භෝජනයට ද සමගය.

sinhalaebooks.com

එසේ යන අතරමගදි මල්ලිකා ජෝශප් මහතා අමතා,

**"අපි අද කළුතරට ම යන නිසා මේ නිවාඩු දවසෙ ෆිල්ම් එකක් බලමුද?"**

කියා යෝජනා කළාය.

ජෝශප් මහතා එම අදහසට එකපයින් කැමැතිවිය. ඔවුන් දෙදෙනා ඒ දිනවල ප්‍රදර්ශනය වෙමින් තිබූ ජනප්‍රිය හින්දි සිනමා පටයක් වූ "ආරාධනා" නැරඹීමට කළුතර "මිනර්වා" සිනමා හලට ඇතුළු වූයේ පළමුවන පන්තියේ ආසන වෙන්කර ගනිමිනි.

මේ අතර ඇන්තනිද තේජානි සමග කලින් සාකච්ඡා කර ගෙන තිබූ පරිදි ඒ දිනවල ප්‍රදර්ශනය වෙමින් තිබූ එම හින්දි සිනමා පටය නැරඹීම සඳහා ඇයද කැඳවා ගෙන එදා කල් ඇතිවම කළුතර "මිනර්වා" සිනමා හලට ඇතුළු වූයේ ජෝශප් මල්ලිකා ජෝඩුව පැමිණෙන්නට පෙරාතුවය.

ඒ අනුව ජෝශප් හා මල්ලිකා සිනමා පටය නරඹා අසල තිබූ දොරටුවෙන් පිටතට නික්මුණ මොහොතේම පහළින් පිහිටි ඊළඟ දොරටුවකින් කාන්තාවකගේ අතින් අල්ලා ගෙන පිටතට පැමිණි යුවළක් දුටු ජෝශප් මහතා මල්ලිකාගේ පිටට තට්ටුකර ,

අර ඇන්තනි නොවේදැයි විමසීය.

මල්ලිකාට ඇස් අදහගත නොහැකි විය. සැබවින්ම එය ඇන්තනිය.

sinhalaebooks.com

මල්ලිකා වහාම පිරිස අතරින් මිදී ඔවුන් සමීපයට යන්නට තැත් කරද්දීම ජෝශප් මහතා සහ මල්ලිකාව දුටු ඇන්තනි වහාම ක්‍රියාත්මක වී ළඟ ම තිබූ කුලී රථයක නැගී තේජානි සමග නික්ම ගියේය.

කෙසේ නමුත් එදා එම සිනමා පටය නරඹන්නට ගිය වතු අධිකාරී කාර්යාලයේ වෙනත් කාන්තාවක් එම ජෝඩු දෙකම දැක හඳුනාගෙන තිබූ අතර එම ජෝඩු දෙකටම මුවා වී ඔවුන් මුණ ගැසීමෙන් තොරව පිටත්ව අවුත් පසුදා උදෙන්ම ආරංචිය කාර්යාලයටදී තිබුණි. වතු අධිකාරී කාර්යාලයේ අය උණුසුම් වූයේ ඒ අනුවය.

මල්ලිකාට නැවත ඇන්තනි දැක ගනන්ට ලැබුණේ කළුතර දිසා අධිකරණයේ ඇන්තනි විසින් පවරා තිබූ දික්කසාද නඩුව කැඳවනු ලැබූ දවසේය.